# ජාතික ගමනාගමන කොමිෂන් සභාව

**විද්‍යුත් ප්‍රදර්ශන පුවරුව තුල (Digital Display Boards - LED) බස් කාලසටහන්,**

**වෙළඳ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ආයතනයක් තෝරා ගැනීම**

**(බැස්ටියන්මාවත බස් පර්යන්තය)**


ජාතික ගමනා ගමන කොමිෂන් සභාව

අංක. 241

උද්‍යාන පාර

කොළඹ 05

[www.ntc@gov.lk](www.ntc@gov.lk)

# ජාතික ගමනාගමන කොමිෂන් සභාව

## විද්‍යුත් ප්‍රදර්ශන පුවරුව තුල වෙළඳ ප්‍රචාරණ අයිතිය පැවරීම සඳහා මිල ගණන් කැඳවීම

ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නවීන තාක්ෂණයෙන් යුත් විද්‍යුත් ප්‍රදර්ශන පුවරුවක් (Digital Display Board – LED) බැස්ටියන් මාවත ප්‍රධාන බස් පර්යන්තයෙහි සවි කර ඇත. මෙම විද්‍යුත් ප්‍රදර්ශන පුවරුවේ ප්‍රමාණය අඩි 16 x 10 වේ.

මෙම විද්‍යුත් ප්‍රදර්ශන පුවරු මගින් ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ පණිවුඩ ලබාදීම මෙන්ම වෙළඳ දැන්වීම් ප්‍රචාරනය සඳහාද පුළුල්වූ අවකාශයක් සලසා දී ඇත.

මේ සඳහා උනන්දුවක් දක්වන ලියාපදිංචි දැන්වීම් ප්‍රචාරක ආයතනවලට, අදාළ විස්තර පත්‍රිකාව ජා.ග.කො.සභාවේ නිල වෙබ් අඩවිය www.ntc.gov.lk මගින් ලබා ගැනීමේ හැකියාව සලසා ඇති අතර අදාල අයදුම්පත 2019/03/01 දින සිට 2019/03/14 දින දක්වා පෙ.ව 10.00 සිට ප.ව. 3.00 දක්වා ආපසු නොගෙවනු ලබන රු. 1500.00 මුදලක්, ගෙවීමෙන් ජා.ග.කො.ස. ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත හැක.

මුද්‍රා තබන ලද මිල ගණන් **2019/03 /15 දින පෙ.ව. 11.00** ට පෙර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. එදිනම පෙ.ව. 11.00 ට ලංසු ලේඛන විවෘත කරන අතර එම අවස්ථාවට මිල ගණන් ඉදිරිපත් කළ අයට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතවරුන්ට සහභාගී විය හැක.වැඩිදුර විස්තර 011 2503969 යන අංකයෙන් ලබාගත හැකිය.

සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව,
241, උද්‍යාන පාර,
කොළඹ 05.

<u>කොන්දේසි මාලාව</u>

**කොන්ත්‍රාත් කාලය වසරකි**

1. විද්‍යුත් ප්‍රදර්ශන පුවරු තිරයේ මුළු ධාවන කාලයෙන් 50% ක් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ දත්ත සඳහා ලබා දිය යුතුය.

2. මෙවැනි කාර්යයක් සාර්ථකව ඉටුකිරීම සඳහා අදාළ ආයතනය සතු තාක්ෂණික, මූල්‍යමය සම්පත්, මාධ්‍ය භාවිතය පිළිබඳ හැකියාව හා සුදුසුකම් සනාථ කළ යුතු අතර, අදාළ යෝජනාවලියට ඊට අදාළ සාක්ෂි ඇතුළත් කළ යුතුය.

3. දැන්වීම් ප්‍රචාරණය සඳහා තෝරාගන්නා ආයතනය සියලුම දැන්වීම්, ප්‍රචාරණයට පෙර ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය.

4. තෝරා ගන්නා ආයතනය ජා.ග.කො.ස මගින් ලබාදෙන ධාවන කාලසටහන්/අනෙකුත් දත්ත ප්‍රචාරය කිරීමට බැඳී සිටින අතර තම දත්ත වඩාත් නිර්මාණාත්මක හා යාවත්කාලීන ලෙස ඉදිරිපත් කිරීමේ හැකියාව තෝරා ගන්නා දැන්වීම් ප්‍රචාරණ ආයතනයේ මුඛ්‍ය වගකීම විය යුතුය.

5. දැන්වීම් ප්‍රචාරය සඳහා තෝරාගන්නා ආයතනය මාස 3 ක පරිවාස කාලයකට යටත්වන අතර, එම කාලයේ දක්වන හැකියාව පිළිබඳ ජාගකොස සෑහිමකට පත්වන්නේ නම් පමණක් ගිවිසුම දීර්ඝ කෙරේ.

6. අසභ්‍ය දර්ශන,මත්පැන් හා දුම්වැටි ප්‍රචාරණ දැන්වීම් සහ මාධ්‍ය සදාචාරයට පටහැනි දර්ශන ප්‍රදර්ශනය කිරිම සපුරා තහනම් වේ. එසේම පවත්නා නීති රීතිවලට යටත්ව දැන්වීම් ප්‍රචාරය කල යුතුය.

7. තෝරාගත් ආයතනය අදාල කොන්දේසි වලට පටහැනිව කටයුතු කළහොත් ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් පළමුව අවවාද කරන අතර මාස 01 ක් ඇතුළත සතුටුදායක ප්‍රගතියක් නොපෙන්වයි නම් සේවාව සැපයීම සඳහා නැවත යෝජනා කැඳවීම සිදු කරනු ලබයි.

8. විද්‍යුත් ප්‍රදර්ශන පුවරු සඳහා සපයා ඇති වගකීම් කාලය අවසන් වූ පසු තෝරා ගන්නා ලද ආයතනය විද්‍යුත් ප්‍රදර්ශන පුවරු නඩත්තු/සේවා සිදුකර, සක්‍රීය මට්ටමින් පවත්වාගෙන යෑම සිදුකල යුතුය.

**9. <u>ලංසු සුරක්ෂණය (Bid Security)</u>**

සියලුම යෝජනා රු. 20,000.00 ක පිළිගතහැකි ලංසු සුරක්ෂණයක් සහිතව ඉදිරිපත් කළ යුතුය. ලංසු වලංගු කාලය ලංසු විවෘත කරන දින සිට මාස 03 කි. (දින 90ක්) ලංසු සුරක්ෂණයේ ආදර්ශයක් අමුණා ඇත. ඇමුණුම - 1)

**10. <u>කාර්ය සාධන සුරක්ෂණය (Performance Security)</u>**

තෝරාගත් මාධ්‍ය ආයතනය කාර්ය සාධන සුරක්ෂණයක් ලෙස රු.100,000.00 ක ඇප මුදලක් තැන්පත් කළ යුතු අතර, අදාළ කාර්යය පැවරීමත් සමගම ලිඛිත කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතුය.

11. විද්‍යුත් ප්‍රදර්ශන පුවරුව සඳහා මසකට ඉදිරිපත් කරන මුදල අනුව <u>වැඩිම මුළු මුදලක්</u> ඉදිරිපත් කරන ආයතනය තෝරා ගනු ඇත.

12. ටෙන්ඩරය සඳහා ඔබ ඉදිරිපත් කරන මුළු මුදල ඊළඟ මාසයේ 05 වන දිනට පෙර ගෙවිය යුතුය. මෙසේ මාස 03 ක කාලයක් ගෙවීම් පැහැර හරින්නේ නම් එය ගිවිසුම අහෝසිවීමට හේතුවක් වනු ඇත.

13. විද්‍යුත් ප්‍රදර්ශන පුවරුව සඳහා සපයා ඇති විදුලිය සඳහා වන වියදම අදාල ආයතනය විසින් දැරිය යුතුය. මාස 02 කට වඩා විදුලි බිල්පත් නොගෙවන්නේ නම් , එය ගිවිසුම අහෝසිවීමට හේතු වනු ඇත.

**14. අදාළ මාධ්‍ය ආයතනය තෝරා ගැනීමෙන් පසුව යම් සාපරාධී ක්‍රියාවක් හෝ මාධ්‍ය සදාචාරයට පටහැනි යම් ක්‍රියාවක් සිදු කරයි නම් එවැනි ඕනෑම අවස්ථාවක අදාළ ගිවිසුම අවලංගු කිරීමේ පූර්ණ අයිතිය ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතුය.**

අදාළ ආයතනය යෝජනාවලිය සමග පහත ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**1. යෝජනාවලිය**

එසේම **යෝජනාවලිය** ඉදිරිපත් කරන ආයතනය

- නිර්මාණාත්මක (Creative)
- උපායශීලී (Strategy)
- සැලසම්සහගත මාධ්‍ය භාවිතය (Media Plan)

කෙරෙහි සැලකිලිමත් වෙමින් යෝජනාවලිය ඉදිරිපත් කල යුතුය.

**2. සම්පූර්ණ මිල ඉදිරිපත් කිරිම (ලබා දී ඇති මිල කැඳවීමේ පත්‍රිකාවට අනුව)**

**3. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ලබාදී ඇති කොන්දේසිවලට එකඟත්වය**

**4. අදාළ ආයතනයේ කාර්ය දර්ශකය (Profile)**

**5. අදාළ ආයතනයේ ජීව දත්ත විස්තර (කාර්ය මණ්ඩලයේ)**

**6. ව්‍යාපාර ලියාපදිංචිය (පිටපත් ඇමිණිය යුතුය.)**

**7. වැට් ලියාපදිංචි සහතිකය (පිටපත් ඇමිණිය යුතුය.)**

**8. ප්‍රචාරණ ආයතනයක් ලෙස අදාළ ක්ෂේත්‍රය පළ පුරුද්ද, අදාළ සහතිකවල පිටපත්, ආයතන ලිඛිතව ඇමිණිය යුතුය.**

**9.පසුගිය වසර 03ක වාර්ෂික පිරිවැටුම සනාථ කෙරෙන ලියවිලි ඇමිණිය යුතුය.**

**10.** අදාල අයදුම්පත 2019 /03 / 01 දින සිට 2019 /03/14 දින දක්වා පෙ.ව 10.00 සිට ප.ව. 3.00 දක්වා ආපසු නොගෙවනු ලබන රු. 1500.00 මුදලක්, ගෙවීමෙන් ජා.ග.කො.ස. ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත හැක.